**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**

**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

DRP

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටි ඒකක සඳහා වන IP දුරකථන 652 ක් සහිත PABX පද්ධතිය සඳහා වසරක කාලයකට සේවා සහ නඩත්තු ගිවිසුමක් ප්‍රසම්පාදනය.

**ලංසු අංකය : DRP/ACC/07/38/2026**

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටි ඒකකයන්හි ඇති IP දුරකථන 652 ක් සහිත PABX පද්ධතිය සඳහා වසරක කාලයකට සේවා සහ නඩත්තු ගිවිසුමක් ප්‍රසම්පාදනය වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයැවේ

3. මේ සඳහා උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බත්තරමුල්ල "සුහුරුපාය", පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ගණකාධිකාරී (ප්‍රසම්පාදන), වෙතින් 011-5226172 දුරකථන අංකය ඔස්සේ වැඩකරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක. ලංසු ලේඛන 2026.08.24 දින සිට 2026.09.07 දක්වා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය, C පර්යන්තය, 12 වැනි මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ස්ථානයෙන් නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.drp.gov.lk) හරහා ද පරීක්ෂා කළ හැක.

4. නැවත නොගෙවන ගාස්තුවක් ලෙස රුපියල් තුන්දහස් පන්සියයක (රු. 3,500/=) මුදලක් ගෙවීමෙන් අනතුරුව, බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 12 වැනි මහල, C ගොඩනැගිල්ල, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.08.24 දින සිට 2026.09.07 දක්වා වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් කළ යුතුය.

5. ලංසු "මුල් පිටපත" සහ " අනු පිටපත" ලෙස සඳහන් කර පිටපත් දෙකකින්, එකම මුද්‍රා තැබූ කවරයක බහා, 2026.09.08 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර 3 වන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ගෙනවිත් භාරදිය යුතුය. නැතහොත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, C ගොඩනැගිල්ල, 12 වැනි මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල හි ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට තැන්පත් කළ යුතුය. ලංසු භාරගන්නා අවසාන දින සිට දින හැත්තෑ හතක් (77) දක්වා හෝ මිලදී ගන්නා පාර්ශ්වය විසින් නියම කරනු ලබන දීර්ඝ කළ දිනයක් දක්වා ලංසුව වලංගු විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

6. කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු අංකය ලංසු කවරයේ ඉහළ වම් පස කෙළවරේ සඳහන් කළ යුතුය. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් කොමසාරිස් ජනරාල් වෙත නිකුත් කරන ලද, පළමු ඉල්ලීමේදීම මාරු කළ හැකි රුපියල් එක්ලක්ෂ තිස්පන් දහසක් (135,000/=) ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය; ලංසු ඇපකරය 2026.09.08 සිට 2026.11.24 දක්වා වලංගු විය යුතු අතර, නැතහොත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සරප් වෙත නැවත ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ලබා ගැනීමෙන් ද සිදු කළ හැක.

7. තෝරාගනු ලබන සාර්ථක ලංසුකරු **2026.10.12** දින සිට සේවාව ආරම්භ කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,**
**12 වන මහල, "සුහුරුපාය",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**